සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - බෞද්ධ ශිෂ්ටාචාරය

සතිය - ජූනි - 4

ශ්‍රේණිය - 12

සකස් කළේ- පවිත්‍රා උඩුවරආරච්චි,ර/ගල්ලෑල්ල ම.වි.

**නිපුණතාව : බුදුරජාණන් වහන්සේගේ හා පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ විශිෂ්ට චරිත ලක්ෂණ අධ්‍යනය කර ආදර්ශයට ගනීයි.**

**නිපුණතා මට්ටම : බුද්ධ කාලීන පරමාදර්ශී ගිහි - පැවිදි, ශ්‍රාවක - ශ්‍රාවිකා චරිත ඇගයීමට ලක්කරයි.**

**01.** මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ දෙමාපියන් වන්නේ,
1. අංජන ශාක්‍යා හා යසෝධරා දේවිය
2. අංජන ශාක්‍යා හා සාමාවතී දේවිය
3. අංජන ශාක්‍යා හා මහා මායා දේවිය
4. අංජන ශාක්‍යා හා කෝසල මල්ලිකා දේවිය
5. අංජන ශාක්‍යා හා බිම්බා දේවිය

**02.** ප්‍රජාපතී ගෝතමී දේවියගේ දරුවන් වන්නේ,
1. නන්ද කුමරු හා සාමා කුමරිය
2. නන්ද කුමරු හා සුමනා කුමරිය
3. නන්ද කුමරු හා තිසුපවාලා කුමරිය
4. නන්ද කුමරු හා රූපා නන්දා කුමරිය
5. නන්ද කුමරු හා භද්‍රා කුමරිය

**03.** ශාක්‍ය හා කෝලිය වංශිකයන් අතර ප්‍රශ්නයක් පැන නැගුනේ.
1. චම්පා නදියේ ජලය සම්බන්ධයෙනි
2. රෝහිණී නදියේ ජලය සම්බන්ධයෙනි
3. අචිරවතී නදියේ ජලය සම්බන්ධයෙනි
4. ගංගා නදියේ ජලය සම්බන්ධයෙනි
5. යමුනා නදියේ ජලය සම්බන්ධයෙනි

**04.** ප්‍රජාපතී ගෝතමී දේවිය හා පන්සියයක් කුමාරිකාවන් පැවිදි බව ලබා ගත්තේ බුදුරදුන්,
1. බරණැස ඉසිපතන මිගදායේ වැඩ සිටිය දී
2. ජීවක අඹ උයනේ වැඩ සිටිය දී
3. ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනෙහිදී
4. මගධයේ වේළුවනාරාමයේ වැඩ සිටිය දී
5. වේශාලියෙහි කූඨාගාර ශාලාවේ වැඩ සිටිය දී

**05.** ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුලු කාන්තාවන් පැවිදි හා උපසම්පදාව ලැබුවේ,
1. අෂ්ට සමාපත්ති පිළිගැනීමෙනි
2. අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙනි
3. අෂ්ට ලෝක ධර්මය පිළිගැනීමෙනි

4. අෂ්ට ආයී ධර්මය පිළිගැනීමෙනි
5. සප්ත අපරිහාණිය ධර්ම පිළිගැනීමෙනි

**06.** ප්‍රජාපතී ගෝතමී තෙරණිය සමග පැවිදි වූ අනිත් කාන්තාවන් පන්සියය රහත් වූයේ,
1. ආදිත්ත පරියාය සූත්‍රය ඇසීමෙනි
2. නන්දකෝවාද සූත්‍රය ඇසීමෙනි
3. අනන්තලක්ඛන සූත්‍රය ඇසීමෙනි
4. තිරෝකුච්ච සූත්‍රය ඇසීමෙනි
5. ආසිවිසෝපම සූත්‍රය ඇසීමෙනි

**07.** ප්‍රජාපතී ගෝතමී තෙරණියට ලැබුණ අගතනතුර වන්නේ,
1. චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
2. අභිඥාලාභී භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
3. ඍද්ධිමතුන් භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
4. මහා ප්‍රාඥා භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
5. ධර්ම කථික භික්ෂුණීන් අතර අග්‍රස්ථානය

**08.** ප්‍රජාපතී ගෝතමී තෙරණිය ඇතුලු තෙරණින් වහන්සේලාට භිෂුණී ආරාමයක් සාදා දුන්නේ,
1. කාලාම වැසියන්
2. ශාක්‍ය රජ දරුවන්
3. ලිච්ඡවී රජ දරුවන්
4. කොසොල් රට වැසියන්
5. කුරු රට වැසියන්

**09.** බුදු රජාණන් වහන්සේ ඍෂ්‍යාධාර භාවිත කොට රූපයේ යථා තත්වය පැහැදිලි කර දුන්නේ,
1. උප්පලවන්නාවටය
2. යසෝධරාවටය
3. අම්බපාලියටය
4. ඛේමාවන්ටය
5. ධම්මදින්නටය

**10.** උපායශීලීත්වයෙන් තමාගේ අග බිසව දහමට යොමු කර වූයේ,
1. බිම්බිසාර රජුය
2. කොසොල් රජුය
3. කණ්ඩපජ්ජෝත රජුය
4. උදේන රජුය
5. අජාසත් රජුය

**11.** ඛේමා බිසවගේ පියාණන් වූයේ,
1. දෙව්දහ නුවර සුප්පබුද්ධ රජතුමා
2. දෙව්දහ නුවර අංජන රජතුමා
3. මද්‍රරට සාගල නුවර මද්දව රජතුමා
4. කොසොල් රට කොසොල් රජතුමා
5. අවන්ති ජනපදයේ චණ්ඩප්ජෝත රජතුමා

**12.** ඛේමා බිසවට ලැබුණු අගතනතුර වූයේ,

1. චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
2. අභිඥාලාභී භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
3. ඍද්ධිමතුන් භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
4. මහා ප්‍රාඥා භික්ෂුණීන් අතර අග්‍රස්ථානය
5. ධර්ම කථික භික්ෂුණීන් අතර අග්‍රස්ථානය

**13.** ඛේමා තෙරණිය රහත් වූයේ,

1. මහා නිදාන සූත්‍රය ඇසීමෙනි
2. ආදිත්ත පරියාය සූත්‍රය ඇසීමෙනි
3. අනත්තලක්ඛන සූත්‍රය ඇසීමෙනි
4. මහාසීහනාද සූත්‍රය ඇසීමෙනි
5. සිංසපා සූත්‍රය ඇසීමෙනි

**14.** බිම්බිසාර රජුගේ අවසරය ඇතිව ඛේමාවන් පැවිදි වී සිවුපිළිසිඹියා සහිතව රහත් භාවයට පත් විය. සිවුපිළිසිඹියා නම්,

1. ඡන්ද, ද්වේශ, භය, මෝහ
2. අර්ථ, ධර්ම, නිරුත්ති, පටිභාන
3. දානය, ප්‍රිය වචනය, අර්ථ, චර්යාව, සමානාත්මතාව
4. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
5. ශ්‍රද්ධා, වීර්ය, ශීල, සුත

**15.** සැවත් නුවර සුමන සිටුවරයාගේ පුත්‍රයා වන්නේ,

1. ධම්මික
2. යස
3. සුජාත
4. සුදත්ත
5. උපක

**16.** අනේපිඩු සිටු තුමන් පළමුවරට බුදුරජාණන් වහන්සේ මුනගැසුනේ,

1. සීත වනයේදී
2. ඉච්ඡානංගල වනයේදී
3. ඇට්ටේරියා වනයේදී
4. තල් වනයේදී
5. අඹ වනයේදී

**17.** ජේතවන්නාරාමය ඉදි කිරීම සඳහා අනේපිඩු සිටුතුමා ඉඩම මිලදී ගැනීමට ජේත කුමාරයාට දුන් වටිනාකම වන්නේ,

1. කහවනු නව කෝටියක්
2. කහවනු දහ අට කෝටියක්
3. කහවනු දහ කෝටියක්
4. කහවනු අට කෝටියක්

5. කහවනු පනස් හතර කෝටියක්

**18.** සුදත්ත සිටුවරයාගේ සකෘදාගාමී ඵලයට පත් වී සිටි දියණිය වන්නේ,

1. විශාකාව
2. සාමා
3. චාලා
4. මාලා
5. සුමනා

**19.** අනේ පිඩු සිටු තුමන් මිය ගොස් උසස් දෙව් පුතකුව දෙව්මට පැමිණ බුදුරදුන් ඉදිරියේ සැරියුත් තෙරණුවන්ගේ ගුණ වර්නාන කළ බව සදහන් වන්නේ,

1. ධම්මපදට්ඨ කථාවේ
2. මනෝරථ පූරණී අටුවා ග්‍රන්ථයේ
3. සුදත්ත සූත්‍රයේ
4. ධම්මචේතිය සූත්‍රයේ
5. චූල්ලවේදල්ල සූත්‍රයේ

**20.** අනාථ පිණ්ඩික උපාසක තුමාට ලැබුනු අගතනතුර වන්නේ,

1. දන්දීමේ ඇලුණු උවසුන් අතර අග තනතුර
2. ධර්ම කථික උවසුන් අතර අග තනතුර
3. ශික්ෂාකාමී උවසුන් අතර අග තනතුර
4. ඇදහිය හැකි කථා ඇති උවසුන් අතර අග තනතුර
5. අල්පේච්ඡ උවසුන් අතර අග තනතුර